IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව -

ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව 2023/24

(දෙවන සෙමෙස්තරය)

පවත්වන ලද්දේ (අප්‍රේල් 2024)

# DY 05 - දේශපාලන විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න. විභාගය අවසානයේ සියලුම පිටු අංක පිළිවෙලට එකට ගැට ගසන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාගශාලාධිපතිට දැනුම් දෙන්න.

01. 16 වන සියවසේ සිට ශ්‍රී ලංකාවේ පැවති යටත්විජිතවාදය පිළිබඳ විමර්ශනයක යෙදෙන්න.

**(මුළු ලකුණු 25)**

02. ඩොනමෝර් ක්‍රමයේ මූලික යෝජනා සහ එහි යහපත් හා අයහපත් අංශ විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

**(මුළු ලකුණු 25)**

03.

I. 1948 මෙරටට නිදහස ලැබීම සහ 1947 සෝල්බරි ව්‍යවස්ථාව ගොඩනැගීමේ පසුබිම් සාධක විමසන්න.

**(ලකුණු 12 1/2)**

II. 1947 ආණ්ඩුක්‍රම ව්‍යුහය එහි මූලිකාංගවලට අවධානය යොමු කරමින් විග්‍රහ කරන්න.

**(ලකුණු 12 1/2)**
**(මුළු ලකුණු 25)**

04.

I. ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් කිරීම පිළිබඳ අදහසේ වර්ධනය සහ 1972 දී එය ක්‍රියාවට නැංවීම පිළිබඳ සාකච්ඡා කරන්න.

**(ලකුණු 12 1/2)**

II. 1972 ව්‍යවස්ථාවේ නවාංග පැහැදිලි කරන්න.

**(ලකුණු 12 1/2)**
**(මුළු ලකුණු 25)**

05.

I. ශ්‍රී ලංකා දේශපාලන පක්ෂ ක්‍රමයේ පැවැති මූලික ලක්ෂණ තුලනාත්මකව විග්‍රහ කරන්න.

**(ලකුණු 12 1/2)**

II. ශ්‍රී ලංකාවේ වර්තමාන දේශපාලන පක්ෂ ක්‍රමය තුළ පැවැති සාම්ප්‍රදායික ලක්ෂණ බිඳවැටී ඇත්දැයි ඔබ සිතන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

**(ලකුණු 12 1/2)**
**(මුළු ලකුණු 25)**

06.

I. 1978 ශ්‍රී ලංකාවේ ජනාධිපති ආණ්ඩුක්‍රමයක් ඇති කිරීමේ පසුබිම් කරුණු සාකාච්ඡා කරන්න.

**(ලකුණු 12 1/2)**

II. 1978 ජනාධිපති ආණ්ඩු ක්‍රමයේ ආයතනික ව්‍යුහය විවේචනාත්මකව විමසන්න.

**(ලකුණු 12 1/2)**
**(මුළු ලකුණු 25)**

********************************

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව -

ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව 202 -32/4

(දෙවන සෙමෙස්තරය)

පවත්වන ලද්දේ පවත්වන ලද්දේ) (මාර්තු 2024)

# DY 06 - විද්‍යාව හා තාක්ෂණවේදය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු පහකින් (05) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න. විභාගය අවසානයේ සියලුම පිටු අංක පිළිවෙලට එකට ගැට ගසන්න.


(5) ගණක යන්ත්‍ර භාවිතා කළ හැකිය .

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාගශාලාධිපතිට දැනුම් දෙන්න.

1)

a. විද්‍යාත්මක ක්‍රමය ගැලීම් සටහනක් මඟින් නිරූපනය කරන්න. (ලකුණු 6)

b. පහත රූපයේ දැක්වෙන්නේ එක්තරා මෝටර් රථයක චලිතය නිරූපනය කෙරෙන ප්‍රවේග-කාල ප්‍රස්තාරය යි.




i. t=0 සිට t=2 s දක්වා රථයේ ත්වරණය ගණනය කරන්න. (ලකුණු 3)

ii. මෝටර් රථය ඒකාකාර ප්‍රවේගයෙන් චලනය වූ කාලය කොපමණද? (ලකුණු 2)

iii. මෝටර් රථයේ මුළු විස්ථාපනය ගණනය කරන්න. (ලකුණු 4)

c.

i. නිව්ටන්ගේ තුන්වන නියමය සඳහන් කරන්න. (ලකුණු 2)

ii. රයිෆලයකින් වෙඩි තැබීමේදී රයිෆලය නැවත පොලා පනියි. වඩා වැඩි ත්වරණයක් ඇත්තේ උණ්ඩයට ද? රයිෆලයට ද? නිව්ටන්ගේ තුන්වන නියමය ඇසුරින් පහදන්න.

(ලකුණු 3)
(මුළු ලකුණු 20)

2)

a. ද්‍රව්‍ය සතු විද්‍යුත් ගුණාංග සළකා බැලීමෙන්, ඒවා මූලික කාණ්ඩ තුනකට බෙදා දැක්විය හැකිය. එම කාණ්ඩ තුන සඳහන් කර උදාහරණ දෙක බැගින් දෙන්න.

(ලකුණු 3×2)


b.

i. සෘජු ධාරාව සහ ප්‍රත්‍යාවර්ථක ධාරාව වෙන් වෙන්ව රූප සටහනකින් ඇඳ දක්වන්න.
(ලකුණු 2×2)

ii. අප නිවෙස් වෙතට සැපයෙන ප්‍රත්‍යාවර්ථක ධාරාවේ සංඛ්‍යාතය 50 Hz වේ. මෙහි චක්‍රීය කාලය ගණනය කරන්න.

(ලකුණු 3)

c. ගෘහ විද්‍යුත් පරිපථයක ඇති කොටස් අනුපිළිවෙළින් පහත රූපයේ පෙන්වා ඇත.





i. A, B හා C කොටස් නම් කරන්න. (ලකුණු 1×3)

ii. B හි ක්‍රියාකාරීත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

d. රූප සටහනේ පෙන්වා ඇති කුරුල්ලාට විදුලි සැර නොවදින අතර මිනිසාට විදුලි සැර වදියි. මෙයට හේතුව පහදන්න.

(ලකුණු 2)




(මුළු ලකුණු 20)

3)

a. ඉලෙක්ට්‍රොනික පරිපථ වල භාවිතා වන සංරචක සක්‍රීය (active) සහ උදාසීන (passive) යනුවෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැක. මේවා හඳුන්වා දී උදාහරණ දෙක බැගින් දෙන්න.

(ලකුණු 2×2)

b. විභව අන්තරයකට සම්බන්ධ කරන ලද ශ්‍රේණිගත සහ සමාන්තරගත ප්‍රතිරෝධක වලින් සමන්විත පද්ධතියක් පහත රූපයේ දී ඇත.




i. ප්‍රතිරෝධක පද්ධතියේ සමක ප්‍රතිරෝධය සොයන්න. (ලකුණු 6)

ii. 6 Ω ප්‍රතිරෝධකය තුළින් ගලන ධාරාව කොපමණද? (ලකුණු 3)

iii. සමක ප්‍රතිරෝධය හරහා සිදුවන ශක්ති හානිය ගණනය කරන්න. (ලකුණු 3)

c. විදුලි කේතලයක් උපයෝගී කර ගනිමින් යම් ද්‍රාවණයක 330 g ක උෂ්ණත්වය 27 $^0$C සිට 50 $^0$C තෙක් ඉහළ නංවයි. තාපන දඟරයේ ශක්ති හානිය 10 kJ නම්, ද්‍රවයේ විශිෂ්ඨ තාප ධාරිතාව ගණනය කරන්න.

(ලකුණු 4)

(මුළු ලකුණු 20)

4)

a. අප වටා ඇති වායු ගෝලය අධ්‍යයනය කිරීමේ පහසුව සඳහා උප ගෝල කිහිපයකට බෙදා දක්වා ඇත.

i. මෙම බෙදා දැක්වීම සිදුකර ඇත්තේ කුමන පදනමක් යටතේ ද? (ලකුණු 1)

ii. වායු ගෝලය සමන්විත වන උපගෝල පහ මොනවාදැයි නම් කරන්න. (ලකුණු 5)

b. වායුගෝලය තුළ හරිතාගාර වායූන්ගේ සංයුතිය ඉහළ යාම, ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට තුඩුදෙන කරුණකි. හරිතාගාර වායූන් නිසා ගෝලීය උෂ්ණත්වය ඉහළ යන අයුරු පහදන්න.

(ලකුණු 3)

c. ඕසෝන් ස්ථරය මඟින් UV කිරණ අවශෝෂණය කරගන්නා ආකාරය පැහැදිලි කර, ඕසෝන් ස්ථරය ක්ෂය වීම නිසා ඇතිවන බලපෑම් තුනක් සඳහන් කරන්න.

(ලකුණු 5)

d. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම පාලනය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් කෙටියෙන් පහදන්න.

(ලකුණු 3×2)

(මුළු ලකුණු 20)

5)

a. ජල දූෂණය යනු මිනිසාගේ පැවැත්මට සෘජුවම බලපාන කාරණාවකි. බොහෝවිට ජලය දූෂණය වීම මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදු වුවද, ස්වභාවිකව සිදුවන පරිසර ක්‍රියාකාරකම් නිසාද ජලය දූෂණය වේ.

i. ජල දූෂණය යනුවෙන් අර්ථ දක්වන්නේ කුමක්දැයි හඳුන්වා දී, ප්‍රධාන වශයෙන් ජල දූෂණය වන ආකාර දෙක විග්‍රහ කරන්න.

(ලකුණු 4)

ii. ජල දූෂණයට හේතුවන සාධක තුනක් නම් කර එම සාධක මගින් ජලය දූෂණය වන ආකාරය ගැන කෙටි සටහන් ලියන්න.

(ලකුණු 3×2)

b. අපද්‍රව්‍ය කළමනාකරණය යනු වැඩිවන පරිසර දූෂණය සහ සම්පත් ක්ෂය වී යාම වැනි කාරණා නිසා මිනිසාට ඉතා වැදගත් අංගයකි.

i. අපද්‍රව්‍ය කළමනාකරණය යනුවෙන් සරලව අර්ථ දක්වන්නේ කුමක්ද?

(ලකුණු 4)

ii. අපද්‍රව්‍ය කළමනාකරණයේ විධික්‍රම තුනක් සඳහන් කර ඒවා පැහැදිලි කරන්න.

(ලකුණු 3×2)

(මුළු ලකුණු 20)

IHRA

UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව -**

**ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව 2023/24**

**(දෙවන සෙමෙස්තරය)**

**පවත්වන ලද්දේ (අප්‍රේල් 2024)**

**DY 07 - ව්‍යාපාර පරිසරය**

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න. විභාගය අවසානයේ සියලුම පිටු අංක පිළිවෙලට එකට ගැට ගසන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාගශාලාධිපතිට දැනුම් දෙන්න.

01.

1.ව්‍යාපාර පරිසරය (Business Environment) යන්නෙහි අදහස පැහැදිළි කරන්න.

(ලකුණු 10)

11.ව්‍යාපාර පරිසරයට අදාළ අභ්‍යන්තර (Internal) හා බාහිර (External) සාධක, ව්‍යාපාර සම්බන්ධයෙන් ඇති බැදීම, පෙන්වා දෙන්න

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

02.

1.ඔබ යම් ව්‍යාපාරයක ප්‍රාදේශීය කළමනාකරුවෙක් (Regional Manager) යැයි සිතන්න.

ඔබගේ බලප්‍රදේශයේ ශාඛා කළමනාකරුවන් කැඳවා පවත්වනු ලබන, වසර අග ප්‍රගති සමාලෝචන රුස්වීමේදී (Progress Review Meeting), ඔබ විසින් කරනු ලබන්නට නියමිත ඉදිරිපත් කිරීම සඳහා (Presentation)ඇතුළත් කළයුතු කරුණු මොනවාද යන්න පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

11.ඉදිරිපත් කිරීමක් (Presentation ) හා මහජන ඇමතුම (Public Speaking) අතර වෙනස් කම් දක්වන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

03.

1.නවෝත්පාදකයා (Innovator) හා නිපැයුම්කරුවා (Inventor)අතර වෙනස කුමක්ද ?

(ලකුණු 10)

11.රටක සංවර්ධනය කෙරෙහි නවෝත්පාදකයා(Innovator) හා නිපැයුම්කරුවා (Inventor) ලබාදෙන දායකත්වය විස්තර කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

04.

1. "ව්‍යාපාර පරිසරය කෙරෙහි සමාජ මාධ්‍ය බලපෑම ඉතා සංවේදී ප්‍රවණතාවකි " පැහැදිළි කරන්න.

(ලකුණු 10)

11.සමාජ මාධ්‍ය මගින්, පාරිභෝගිකයින් එක පෙරමුණකට ගොනු කොට, ප්‍රබල බලපෑම් කණ්ඩායමක් ලෙස ගොඩනගා තිබීම, ව්‍යාපාර පරිසරය සම්බන්ධයෙන් බලපාන්නේ කෙසේද ?

(ලකුණු 10 )
(මුළු ලකුණු 20)

05.

1." රාජ්‍යය ප්‍රතිපත්ති ( Government Policies)මගින් ව්‍යාපාර පාලනය කෙරේ" පැහැදිළි කරන්න.

(ලකුණු 10)

11." ව්‍යාපාර දිරිගැන්වීම මෙන්ම අධෛර්ය කිරීම සඳහාත් රජය ක්‍රියා කරයි " පැහැදිළි කරන්න

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

06.

1.කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence) යනු කුමක්දැයි පැහැදිළි කරන්න .

(ලකුණු 10)

11.කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence) මගින් ව්‍යාපාර පරිසරය කෙරෙහි ඇතිකරනු ලබන්නාවූ බලපෑම පෙන්වා දෙන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

7.පහත සඳහන් ඒවා අතරින් හතරක් (04) පිළිබඳව කෙටියෙන් පැහැදිළි කරන්න.

1.නායකත්වය.( Leadership)

2.සම්මුතිය. (Negotiation)

3.උද්ධමනය.(Inflation)

4.මාධ්‍යය නිවේදනය.(Media Release)

5.ශ්‍රීලංකා මහ බැංකුව. (CBSL)

6 මහජන සම්බන්ධතා කළමනාකරණය ( Public Relationship Management)

7.වෙළඳ දැන්වීම්කරණය (Advertising)

(ලකුණු 5*4= මුළු ලකුණු 20)

************************************

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව -

ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව 2023/24

(දෙවන සෙමෙස්තරය)

පවත්වන ලද්දේ (අප්‍රේල් 2024)

# DY 08 - ශ්‍රම අධ්‍යයන මූලධර්ම

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න. විභාගය අවසානයේ සියලුම පිටු අංක පිළිවෙලට එකට ගැට ගසන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාගශාලාධිපතිට දැනුම් දෙන්න.

01.

I. ශ්‍රම බලකාය හඳුන්වා එහි ප්‍රභේද දක්වන්න.

(ලකුණු 10)

II. ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා සපුරාලීම සඳහා රටක ශ්‍රම බලකාය ගුණාත්මකව සකස්විය යුතු ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

02.

I. ශ්‍රමය සමජාති නොවේ. ශ්‍රමය සමජාතිය නොවීමට බලපාන සාධක සඳහන් කරන්න.

(ලකුණු 10)

II. දියුණු හා දියුණුවන රටවල් තුළ භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට ශ්‍රමය යොදා ගැනීම පිළිබඳව දක්නට හැකි වෙනස්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

03. ශ්‍රී ලංකාවේ ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාත (LFPR) අගයන් පහත දක්වා ඇත.

| වර්ෂය | ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතය % | පුරුෂ % | ස්ත්‍රී% |
|---|---|---|---|
| 2020 | 50.6 | 71.9 | 32.0 |
| 2021 | 49.9 | 71.0 | 31.8 |
| 2022 | 49.8 | 70.5 | 32.1 |
| 2023 | 48.8 | 68.4 | 32.0 |

(03 කාර්තුව) (ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේනතුව)

I. ඉහත සංඛ්‍යා ලේඛන අනුව පසුගිය වසර 04 තුළ කාන්තා ශ්‍රම සහභාගිත්වය වර්ධනය වීමක් දක්නට නොමැත. මෙසේ වීමට බලපෑ සාධක පැහැදිලි කරන්න.

(ලකුණු 10)

II. කාන්තා ශ්‍රම සහභාගීත්ව අනුපාතය ඉහළ නැංවීමට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

04.

I. වෘත්තිය සමිතියක ප්‍රධාන පරමාර්ථ මොනවාද?

(ලකුණු 08)

II. "ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරය ආරම්භ වන්නේ කම්කරුවන් අතරින් නොව, ඊට පරිබාහිර වූ බටහිර රටවල අධ්‍යාපනය ලැබූ මධ්‍යම පංතිකයන්ගේ නායකත්වයෙනි. මෙම තත්වය දිගටම පැවතුන අතර, පසු කලක දේශපාලන නායකයන්ද මෙයට නායකත්වය දුන්නේය".

ඉහත ප්‍රකාශය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරය සම්බන්ධව විචාර පූර්වක ඇගයීමක් කරන්න.

**(ලකුණු 12)**
**(මුළු ලකුණු 20)**

05.

I. 1950 අංක 43 කාර්මික ආරවුල් පනත මගින් සේවක රැකියා සුරක්ෂිත කිරීමට යොදා ඇති ප්‍රතිපාදන මොනවාද?

**(ලකුණු 10)**

II. ඉහත ප්‍රතිපාදන අතරින් දෙකක් (02) පිළිබඳව කාර්මික ආරවුල් පනතේ දක්වා ඇති විධිවිධාන ඇසුරින් පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**
**(මුළු ලකුණු 20)**

06. 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත පිළිබඳව නීතිමය තත්වය පැහැදිලි කර, ඉන් ශ්‍රමිකයාට ලැබෙන ප්‍රතිලාභ දක්වා, වර්තමානයට අවශ්‍ය පරිදි සකස් විය යුතු අයුරු ඔබේ යෝජනා සමග පැහැදිලි කරන්න.

**(මුළු ලකුණු 20)**

07. 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත

හෝ

1980 අංක 46 දරණ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනත

ඉහත කී එකක් පිළිබඳව නීතිමය තත්වය පැහැදිලි කර ඉන් ශ්‍රමිකයාට ලැබෙන ප්‍රතිලාභ දක්වා වර්තමානයට අවශ්‍ය පරිදි සකස් විය යුතු ආකාරය ඔබේ යෝජනා සමග පැහැදිලි කරන්න.

**(මුළු ලකුණු 20)**

08. පහත සඳහන් මාතෘකා හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

I. ඌන සේවා නියුක්තිය
II. ජීවන වියදම් දීමනාව
III. සාමූහික කේවල් කිරීම (Collective bargaining)
IV. පඩි පාලක සභා
V. දිරි දීමනා (Incentives)

**(ලකුණු 5*4= මුළු ලකුණු 20)**

***********************************